# 2026 වර්ෂය සඳහා කළමනාකරණ සේවා නිලධාරි සේවයේ

# අභ්‍යන්තර වාර්ෂික අභියාචනා මණ්ඩල රැස්වීම - 2025.09.29

## මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

කළමනාකරණ සේවා නිලධාරි සේවයේ නිලධාරීන්ගේ අභ්‍යන්තර වාර්ෂික අභියාචනා මණ්ඩල රැස්වීම 2025.09.29 දින පෙ.ව. 09.30 ට අමාත්‍යාංශයේදී පහත නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී.

**අභියාචනා මණ්ඩලය :**

එම්.එම්.සී.පී. මොහොට්ටිගෙදර මයා - සභාපති
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්

ටී.එම්.යූ.එස්. ඒකනායක මයා - සමාජික
ප්‍රධාන ගණකාධිකාරී

එස්.කේ.එම්.කේ. ද අල්විස් මිය - සමාජික
අධ්‍යක්ෂ

**වෘත්තිය සමිති නියෝජිතයින් :**

කේ.එස්.කේ. ශ්‍රේරු මහතා - ප්‍රධාන භාණ්ඩාගාරික
සමස්ත ලංකා රාජ්‍ය කළමනාකරණ සහකාර සංගමය

ඒ.ඩී.එච්. නයනජිත් මහතා - සභාපති
රාජ්‍ය කළමනාකරණ සේවා නිලධාරී සංගමය

රෝහිත සෙනෙවිරත්න මහතා - භාණ්ඩාගාරික
කළමනාකරණ සේවා නිලධාරීන්ගේ ජාතික එකමුතුව

2025 අභ්‍යන්තර වාර්ෂික ස්ථාන මාරු තීරණ වලට අදාලව ඉදිරිපත් කර තිබූ අභියාචනා සහ ඒ සඳහා අභියාචනා මණ්ඩලය විසින් ලබා දෙන ලද තීරණ පහත පරිදි වේ.

| | අභියාචනය | ඉදිරිපත් කර ඇති නිලධාරියා | අභියාචනා මණ්ඩල තීරණය |
|---|---|---|---|
| 1 | විදේශ දූත මණ්ඩල සේවයේ යෙදී සිට නැවත මෙම අමාත්‍යාංශයට පැමිණි නිලධාරීන් සඳහා ඔවුන්ගේ අමාත්‍යාංශයේ පෙර සේවාකාලය සමඟ ජ්‍යෙෂ්ඨතා ලේඛනයට ඇතුළත් කිරීම | අමාත්‍යාංශයේ හා අනෙකුත් දෙපාර්තමේන්තුවල සේවය කරන නිලධාරීන් | රජයේ අවශ්‍යතාවයක් මත විභාගයක් සමත් වීමෙන් අනතුරුව විදේශ දූත මණ්ඩල රාජකාරී සඳහා තේරීපත් වූ නිලධාරීන් එම රාජකාරී අවසන් කර නැවත පැමිණීමෙන් අනතුරුව වෙනත් සේවා ස්ථානයක් වෙත නොගොස් මෙම අමාත්‍යාංශය වෙතම පැමිණෙන්නේනම් පමණක් ඔවුන්ගේ පෙර සේවා කාලය අනුව ජ්‍යෙෂ්ඨතා ලේඛනය තුළ රැඳී සිටීමට අවස්ථාව ලබා දිය යුතු බව අභියාචනා මණ්ඩලයේ හා වෘත්තීය සමිති නියෝජිතයින්ගේ තීරණය විය. වෙනත් ප්‍රතිලාභ ලබන සේවා ස්ථානවල සේවය කරමින් සිටියදී දූත මණ්ඩල සේවය සඳහා එකතු වන නිලධාරීන්ටද පෙර සේවා ස්ථානය තුළ ඉතිරි කාලසීමාව රැඳී සිටීමට අවස්ථාව හිමිවන බැවින් මෙම තීරණය වෙනස් නොකරන ලදී. |

| | | | |
|---|---|---|---|
| 2 | රේගු දෙපාර්තමේන්තුවේ රැඳී සිටීමට ඇති කාලසීමාව දීර්ඝ කරගැනීම | එම්.ආර්.එෆ්.එම්. නස්රීන් මිය<br>ජාතික අයවැය දෙපාර්තමේන්තුව | රා.ප.ව. 14/2022 යටතේ 2024.01.01 දිනෙන් පසු නිවාඩු ලබාගත් නිලධාරීන් වෙත නිවාඩු අවසන් කර සේවයට වාර්තා කිරීමෙන් පසු අමාත්‍යාංශයෙන් හෝ අදාළ දෙපාර්තමේන්තුවෙන් පිටතට ස්ථානමාරු ලැබිය යුතු බවට 2025 අභ්‍යන්තර ස්ථානමාරු පටිපාටියේ සඳහන් කර ඇති අතර 2026 වර්ෂයේ අභ්‍යන්තර ස්ථානමාරු අයදුම්පත් කැඳවන අවස්ථාවේද ඒ සම්බන්ධයෙන් සියලු දෙපාර්තමේන්තු ප්‍රධානීන් දැනුවත් කර ඇත.<br><br>ඒ අනුව, මෙම නිලධාරිනිය දෙවනවර සිය නිවාඩු කාලසීමාව දීර්ඝ කරගැනීමේදී මෙම කොන්දේසිය අදාළ වන බැවින් මෙම නිලධාරිය වෙත රේගු දෙපාර්තමේන්තුව වෙත ස්ථානමාරු වීමට අවස්ථාවක් නොමැති අතර කඩිනමින් පිටතට ස්ථානමාරු ලැබිය යුතුවේ. තවද, මෙම නිලධාරිනිය මෙම අමාත්‍යාංශය වෙත පැමිණි දින සිට කිසිදු අවස්ථාවක අභ්‍යන්තර ස්ථානමාරු ඉල්ලුම් නොකිරීමද අමාත්‍යාංශයෙන් පිටතට ස්ථානමාරු ලැබීමට හේතුවේ. |
| 3 | කාලත්‍රයා විදේශ දූත මණ්ඩල සේවයට තේරීපත් වීමත් සමඟ විදේශ ගත වී සිට නැවත සේවයට වාර්තා කර ඇති බැවින් 2026 රේගු දෙපාර්තමේන්තුව වෙත ස්ථානමාරු වීමට අවස්ථාව ලබාගැනීම | බී.ඒ.කේ.එස්.පී. ජයවීර මිය<br>සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව විදෙස්ගත වී ඇති නිලධාරීන් සම්බන්ධයෙන් ක්‍රියාකරන ආකාරය සම්බන්ධයෙන් ස්ථානමාරු පටිපාටිය තුළ සඳහන් නොවන බැවින් මෙම වසර සඳහා පමණක් අවස්ථාව ලබාදේ.<br><br>ඉදිරියේදී මෙවැනි කරුණු සම්බන්ධයෙන් 2027 පටිපාටිය තුළ විධිවිධානයන් වෙනස් කිරීමට තීරණය කරන ලදී.<br><br>විදේශ දූත මණ්ඩල විභාග සමත් වී සහ ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව රැකියා හෝ අධ්‍යයන කටයුතු වෙනුවෙන් විදෙස් ගත වූ නිලධාරීන් විදෙස්ගතව සිටි කාලයට සමාන කාලයක් අමාත්‍යාංශය තුළ රැඳීසිටීම අනිවාර්ය වේ.<br><br>කලත්‍රයා සමඟ විදේශගත වූ නිලධාරීන් අලුතින් අමාත්‍යාංශය වෙත පැමිණි නිලධාරීන් සේ සලකා කටයුතු කරනු ලැබේ. |
| 4 | 2025 වසරේ වයස අවුරුදු 56ක් සම්පූර්ණ වී ඇති බැවින් රේගු දෙපාර්තමේන්තුව වෙත ස්ථානමාරු වීමට ලබාදී ඇති අවස්ථාව ඉදිරි දිනයකට වෙනස් කරගැනීම | බී.ඩී.ඩී. අබේසුන්දර මිය<br>භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව | පෙර වර්ෂ වලදී කළමනාකරණ සේවා නිලධාරීන් සඳහා පමණක් 10:2 ක්‍රමය ක්‍රියාත්මක කල ආකාරය මේ වසරේ සිට සෑම සේවාවකටම පොදු වන සේ ජ්‍යෙෂ්ඨතා ලේඛනයේ සිටින පිළිවෙළට රේගු දෙපාර්තමේන්තුව වෙත ස්ථානමාරු ලබාදීම සිදුකළ යුතු බව තීරණය කරන ලදී. |

| | | | |
|---|---|---|---|
| 5 | අමාත්‍යාංශ විෂය පථයට අයත් නොවූ කාලසීමාව තුළ ආනයන හා අපනයන දෙපාර්තමේන්තුව වෙත පැමිණි නිලධාරීන් දෙපාර්තමේන්තුව අමාත්‍යාංශ විෂය පථයට අයත් වූ දිනට ජ්‍යෙෂ්ඨතා ලේඛනයට ඇතුළත් කරගැනීම | ආනයන හා අපනයන දෙපාර්තමේන්තුවේ සේවය කරන නිලධාරීන් 8ක් (ක.සේ.නි. 5 / ක.සේ.සේ. 3) | අමාත්‍යාංශ විෂය පථයට අයත් නොවූ කාලසීමාව තුළ ආනයන හා අපනයන දෙපාර්තමේන්තුව, රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව හා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව වෙත පැමිණි නිලධාරීන් 2023.12.31 දිනට ජ්‍යෙෂ්ඨතා ලේඛනයට ඇතුළත් කිරීමට ගෙන ඇති තීරණයේ වෙනසක් සිදුනොවන බව දැනුම් දෙන ලදී. |

**එම්.එම්.සී.පී. මොහොට්ටිගෙදර මයා**
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

එම්.එම්.සී.පී. මොහොට්ටිගෙදර
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
කොළඹ 01

**ඊ.එම්.යූ.එස්. ඒකනායක මයා**
ප්‍රධාන ගණකාධිකාරී
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

ඊ.එම්.යූ.එස්. ඒකනායක
ප්‍රධාන ගණකාධිකාරී
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

**එස්.කේ.එම්.කේ. ද අල්විස් මිය**
අධ්‍යක්ෂ
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

එස්.කේ.එම්. කෝකිලා ද අල්විස්
අධ්‍යක්ෂ
ආයතනික කටයුතු අංශය
මුදල් අමාත්‍යාංශය
කොළඹ 01.